# ස්වයං රැකියාව ග්‍රාම සංවර්ධනයට සාර්ථක එළඹුමක් වේද?

**හැඳින්වීම :**

විරැකියාව සහ ඌන සේවා නියුක්තිය බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස ලබා ගත් ද සිට මෙතෙක් බලයට පැමිණි සෑම රජයක්ම වෙහෙසට පත්කළ ප්‍රශ්නයකි. මේ වන විටත් මෙරට අටලක්ෂ පනස් දහසකට ආසන්න පිරිසක් විරැකියාවෙන් පීඩාවට පත්වී සිටිති. ජීවිතයේ සහන් එළියක් සොයමින් දස අතේ දුවන එම ශ්‍රම බලකායට ජයග්‍රහනයක් ලබා ගැනීමේ මග කුමක්ද? ස්වාධීනත්වය හා ස්වෛරීභාවය කවදත් සිය පණ මෙන් ආරක්ෂා කළ, අගය කළ ශ්‍රී ලාංකික ගැමි සමාජයේ අද දක්නට ලැබෙන විරැකියාව හා ඌණසේවා නියුක්තිය තුරන්කොට උසස් ජීවන මට්ටමක් කරා පිය එසවීමට ස්වයං රැකියාව හොඳ එළඹුමක් විය නොහැකිද? පුද්ගල සංවර්ධනයේ ප්‍රතිලාභ සිය පවුල් වෙත ලබාදීමටත්, පවුලේ සංවර්ධනය හවුලේ බෙද ගෙන ගම නඟා සිටුවීමටත් සුදුසු උපක්‍රමයක් ලෙස ස්වයං රැකියාව පිළිබඳව විචාරාත්මකව බැලීමට සුදුසු කාලය මෙයයි.

**ස්වයං රැකියාවල ඓතිහාසික පසුබිම:**

ස්වයං රැකියාව යනු කුමක්දැයි අමුතු වෙන් විස්තර කළයුතු නොවේ. මන්ද? එය ශ්‍රී ලංකාවේ ලිඛිත ඉතිහාසය තරම්ම ඉපැරණි එකක් බැවිණි. ගංගා ආශ්‍රයෙන් ජනපද පිහිටුවා ගත් මෙරට වැසියෝ කෘෂිකර්මය තුලින් සිය මූලික ආර්ථික අඩිතාලම ගොඩනගා ගත්හ. කෘෂි කර්මයට අමතරව ඒ ඒ ජන කොටස් සිය ශිල්පීය දැනුම ප්‍රයෝජනයට ගෙන විවිධ කර්මාන්තවල නියැලෙමින් ස්වයං රැකියා (පාෂාණ පදනම් කරගත්, ලෝහ පදනම් කරගත්, ලී පදනම් කරගත්, මැටි පදනම් කරගත්, කර්මාන්ත) කළ බවට ඓතිහාසික සාධක තිබේ. එද ගැමියන් කෘෂිකර්මාන්තයේම අංගයක් වන සත්ව පාලනයේ නිරත වූහ. ඊට අමතරව ධීවර කර්මාන්තයේ මෙන්ම වෙනත් විවිධ වෘත්තීන්හි යෙදීමෙන්ද තම ජීවනෝපාය සලසා ගත්හ. මෙම විවිධ රැකියා එක් එක් කුලයන් විසින් පවත්වා ගෙන ගිය අතර පැවැති සමාජ ක්‍රමය මගින් එහි ඒකාබද්ධතාවය තහවුරු කරන ලදී. මෙම රැකියා ''යහපත් රැකියා'' වශයෙන් එද බෞද්ධ සමාජයේ පිළිගැනීමට ලක්ව තිබුණි.

> **අතීතයේදී මෙරට යහපත් ආර්ථික හා සාමාජික පරිසරයක් ගොඩනැගීමට ස්වයං රැකියාව බෙහෙවින් ඉවහල් විය. එසේ නම් ග්‍රාමීය සමාජයේ දැනට පවත්නා දිළිඳුකම, ආදායම් විෂමතාවය, දුර්වල පෝෂණ මට්ටම ආදී නොයෙකුත් ගැටළුවලට පිළිතුරු ලබාගැනීම පිණිස ස්වයං රැකියාව එක් සාර්ථක එළඹුමක් විය හැකිය.**

ලංකාවේ ජීවත්වූ පැරණි කලාකරුවන්ගේ, ශිල්පීන්ගේ හා විවිධ ක්ෂේත්‍රවල නිපුණත්වයක් ලද කාර්මිකයින්ගේ කුශලතා අනාගත පරපුරට අහිමිවීමට බලපෑ එක් කරුණක් නම් රැකියාව හා කුලය එකක් සේ, දැඩි ලෙස සම්බන්ධ කොට තැබීමට උත්සාහ දැරීමයි. අනුරාධපුර පොළොන්නරුව වැනි යුගවලදී ග්‍රාමීය ආර්ථික රටාව සකස් වී තිබූ ආකාරයට අනුව ගමේ අවශ්‍යතාවයන් ගම් වැසියන් විසින්ම සපුරාගත්හ. මේ ස්වයං පාලන ක්‍රමයන් වඩාත් පහසු වූයේ සංකීර්ණත්වයෙන් හා පරායත්තතාවයෙන් මිදීම හේතුකොට ගෙන යැයි සිතීමට ඉඩ තිබේ.

පර්යේෂණ හා පුහුණු කිරීමේ
නිලධාරි
**එස්. එම්. කේ. බී. නන්දරත්න**
විසිනි.

පැරණි ශ්‍රී ලාංකිකයන්ගේ කුශලතාවයන්, සමාජ හැකියාවන් හා පාරම්පරික දක්ෂතාවයන් වත්මන් සමාජයට අහිමිවීමට බලපෑ තවත් සාධක කීපයක් තිබේ. එනම්, විදේශීය ආධිපත්‍ය වලට ලංකාව හසුවීමෙන් විදේශීය භාණ්ඩ මෙරටට හඳුන්වා දීම, භාණ්ඩ හුවමාරුව වෙනුවට මුදල් සංසරණය හඳුන්වා දීම හා වැරදි උපාය මාර්ග තුලින් ගම සංවර්ධනය කිරීමට සැළසුම් කිරීමයි. මීට අමතරව සමාජ විපරිනාමයේ ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූ පුද්ගලයින්ගේ ආකල්පමය හා සමාජ ඇගයීම් පද්ධතියේ වෙනස්වීම් තුලින්ද කිසියම් බලපෑමක් ඇතිවූ බව පෙනේ. කෙසේ හෝ වේවා පැරණි ගැමියන් තම ශ්‍රමය අර්ථවත් හා ඵලදායී කටයුත්තක යොදමින් ජීවිකාව පවත්වා ගෙන ගිය බව, අද ශේෂවී තිබෙන උසස් කලා නිර්මාණ, වාරි කර්මාන්ත හා අනෙකුත් සංස්කෘතික දායාදයන් ගෙන් මනා ලෙස ඔප්පු වේ.

**නිදහස ලැබීමෙන් පසු මෙරට ග්‍රාමීය සමාජ ආර්ථික ප්‍රගතිය උදෙසා ගෙන ඇති පියවර :**

මේ වනතුරු බලයට පත් සෑම රජයක්ම ග්‍රාම සංවර්ධනය සඳහා විවිධ සැලසුම් උපයෝගී කරගත්හ. ඒවායින් කීපයක් මෙසේ සඳහන් කළ හැකිය.

1. කෘෂිකාර්මික ගොවි ජනපද පිහිටුවීම
2. කෘෂිකර්මය පදනම් කරගත් මහා පරිමාණ කර්මාන්තශාලා පිහිටුවීම
3. ප්‍රදේශයේ සම්පත් වලින් පවත්වා ගෙන යා හැකි මධ්‍යම පරිමාණයේ කර්මාන්ත ශාලා පිහිටුවීම
4. ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

මේ සියළුම උපාය මාර්ගයන්ගේ අවසාන පරමාර්ථය වූයේ විරැකියාව හා ඌණසේවා නියුක්තිය තුරන්කොට ගම දියුණු කිරීමයි. ගමට මෙතරම් අවධානයක් යොමු කළේ ඇයි? ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 79% ක් ජීවත් වන්නේ ගම්බද ප්‍රදේශ වලයි. රජයට මුහුණ දීමට සිදුවී තිබෙන ප්‍රශ්ණ අතර ආර්ථික වර්ධනය හා සමාජ සාධාරණත්වය අතර යෝග්‍ය සමබරතාවයක් පවත්වා ගෙන යාම වැදගත් තැනක් හිමිකර ගනියි. 1986 ලෝක බැංකු හා ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා අනුව දිවයිනේ ඒක පුද්ගල

දළ ජාතික නිෂ්පාදනය දකුණු ආසියා කලාපයේ සියළුම රටවල් අභිබවා සිටියි. එහෙත් ඒ සමගම විරැකියාව හා ඌණ සේවා නියුක්තියද ඉහළ මට්ටමක පවතී. අධ්‍යාපන මට්ටම් අනුව වර්ග කරන විට මුළු ජනගහනයෙන් රැකියා නොමැති ස්ත්‍රීන්ගේ සංඛ්‍යාව 6.3% ක් වන අතර පිරිමින්ගේ සංඛ්‍යාව 5.6%කි. (1986/87 සමාජ ආර්ථික දත්ත,ශ්‍රී ලංකා මහ බැංකුව 1989) මෙය මුළු ශ්‍රම බලකායේ ප්‍රතිශත යක් ලෙස බැලූ විට 15.5% ප්‍රමාණයකි. පවතින දත්ත අනුව රැකියා නොමැති මුළු ශ්‍රම සංඛ්‍යාව 850,000 ක් පමණ වෙතැයි අදහස් කෙරේ. මෙයින් ග්‍රාමීය අංශයේ විරැකියාවට හසුවී සිටින ප්‍රමාණය 567,000 ක් වන අතර එය මුලු සේවා වියුක්තික ජන සංඛ්‍යාවෙන් 67.5 ක් පමණ වන බව ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව මගින් 1985/86 වර්ෂ සඳහා නිකුත් කළ මූලික වාර්තාවෙන් පෙන්වා දී තිබේ.

1972/76 කාල සීමාව සඳහා පස් අවුරුදු සැළැස්මක් ඉදිරිපත් කළ සැළසුම් විශේෂඥයෝ රැකියා හිඟය දිනෙන් දින උත්සන්න වූයේ අතීතයේදී ද කළ ආයෝජන වලින් රැකියා උත්පාදනය කළහැකි මාර්ග නොසළකා හැරීමේ සෘජු ප්‍රතිඵලයක් නිසා බව අවධාරණය කළහ. ''ග්‍රාමීය සමාජය'' නැවත පන ගැන්වීමට නම් එම ආර්ථිකය වඩා ශක්තිමත් කිරීම සඳහා ප්‍රයත්න දැරිය යුතු බව ඔවුන් පැහැදිලිව පෙන්වා දුන්හ. නමුත් මෙරට ග්‍රාමීය ආර්ථිකය හොඳ පදනමක නොතිබූ බව මෑතකදී ''ජනසවිය'' වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සිදුවීම තුලින් පැහැදිලි වේ. රටේ ජනගහණ යෙන් අඩකටත් වඩා, දිළිඳු බවින් පෙලෙන අතර, ජනතාවගේ පෝෂණ මට්ටමද පිරිහී ගොස් තිබේ. ඊට අමතරව දේශීය නිෂ්පාදනයෙන් 70% ක් පමණම පරිභෝජනය සඳහා වැය කරන බව අලුත් මහ බැංකුවාර්තා හෙලි කරයි.

මෙතෙක් බලයට පත් සෑම රජයක් විසින්ම වැඩි ප්‍රයත්නයක් සහ අවධාන යක් කෘෂිකර්ම අංශයට යොමු කරන ලද අතර, කෘෂිකර්මය දියුණු කිරීම තුලින් අතිරික්ත ශ්‍රම බලකාය එදෙසට නැඹුරු වෙතැයිද අපේක්ෂා කරන ලදී. එනිසා කෘෂිකර්මය දියුණුකිරීම සඳහා පහත සඳහන් පියවරවල් ගැනීමට රජය උත්සුක විය.

* ගොවි නිෂ්පාදන වෙනුවෙන් සහතික මිළක් නියම කිරීම
* ගොවි නිෂ්පාදන අලෙවිය / මිළදී ගැනීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතන පිහිටුවීම
* ණය හා අනෙකුත් යෙදවුම් සහනාධාර ක්‍රමයකට සැපයීම
* වාරිමාර්ග පහසුකම් නොමිළයේ සැපයීම
* කෘෂි ව්‍යාප්ති සේවාවන් දියුණු කිරීම
* ආයතනික සංවර්ධන කටයුතු හඳුන්වා දීම.

යෙන් අඩු ආර්ථික වාසි ලබන්නක් බවයි. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදන යට කෘෂි අංශයේ දයකත්වය 23.8% ක් වූ අතර, කර්මාන්ත 27.5% ක් හා සේවා වන් 48.8% ක් විය. (1986) මෙය 1982 හෝ 1985 වර්ෂ සමග සසඳා බලන විට සැළකිය යුතු පහළ වැටීමකි. ග්‍රාමීය අංශයේ උගත් පිරිසක් ශ්‍රම බලකායට එක් වුවද කෘෂිකර්ම අංශයට කලින් තිබූ නැඹුරුව පිරිහී යාම නිසා ඔවුන් එදෙසට ඇද ගැනීමට නොහැකි විය. මේ නිසා ගම්බද තරුණ පරපුර දැඩි රැකියා හිඟය කට මුහුණ දුනි. එක් පැත්තකින් විරැකියාවෙන් හා ඌණ සේවා නියුක්ති යෙන් පෙලෙද්දී, අනික් පැත්තෙන් රජය යම් යම් සුබසාධක වියදම් කප්පාදු කිරීම තුලින් ග්‍රාමීය අංශයේ ආර්ථික දුබල තාවය තවත් උත්සන්න විය. මෙයින් ආදායම් බෙදී යාමේ විෂමතාවය වැඩිවූ අතර, එය ග්‍රාමීය අංශය තුලින් පැහැදිලිව ම දැකගත හැකි විය.

ග්‍රාමීය අංශයේ තත්ත්වය මෙසේ වෙත්දී නාගරික ජන කොටස් රජයේ විවෘත වෙළඳ ප්‍රතිපත්ති තම ප්‍රයෝජනය ට ගනිමින් මුදල් ඉපයීමේ නව මං සොයන්නට විය. ග්‍රාමීය ජනතාව ඇතැම් විටක ඔවුන්ගේ සූරා කෑම් වලට ලක්විය. ලාභයට මෙන්ම පහසුවෙන් ලබාගත හැකි අතිරික්ත ශ්‍රමය සොයා ගිය මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරිකයෝ සුළු මුදලක් ගෙවා ග්‍රාමීය ශ්‍රමය සූරා කෑමට පුරුදු වූහ. ප්‍රධාන කර්මාන්ත වලට අවශ්‍ය අමතර කොටස් සපයන උප කොන්ත්‍රාත් කරුවෝ රටපුරාම විසුරුන අතර, ඔවුහු ග්‍රාමීය ප්‍රදේශ වලින් ලබාගත් ශ්‍රමය මත ලාභ ඉපයීමට පුරුදු වූහ.

ස්වාභාවිකව පැමිණි බාධකත්, ආර්ථික දුෂ්කරතාත් නිසා කෘෂිකර්මය තුලින් ග්‍රාමීය විරැකියාවට විසඳුමක් ලබා ගැනීම

**රජය අනුගමනය කළ විවෘත ආර්ථික ප්‍රතිපත්තියට අනුකූලව ගොවි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා රාජ්‍ය ආයතන ඉදිරිපත් වීම නතර විය. පොහොර සහනාධාර කපාහැරීම, මහා වාරි මාර්ග සඳහා මෙහෙයුම් හා නඩත්තු ගාස්තු නියමකිරීම; කෘෂි ව්‍යාපෘති සේවා නිලධාරි ක්‍රමය අහෝසි කිරීම; වගා නිලධාරි ක්‍රමය වැනි ප්‍රතිපත්තිමය තීරණවලින් යම්කිසි අනිටු බලපෑමක් සිදුවී ඇති බව ග්‍රාමීය ජනතාවගේ හැඟීමයි!**

කෙසේ වුවද මේවා සියල්ල වර්ෂාව සානයේදී එලෙසින්ම පවතින බවක්. නොපෙනේ. රජයට දරාගත නොහැකි අන්දමින් ආර්ථික පීඩනය උග්‍රවීමත්, රටේ ආරක්ෂාව පතා අධික වියදමක් දරන්නට සිදුවීමත් එසේත් නැතහොත් ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල උපදෙස් නිසා හෝ රජය විසින් කලින් සපයනු ලැබූ ඇතැම් පහසුකම් දිගටම පවත්වා ගෙන යෑම අපහසු විය. **රජය අනුගමනය කළ විවෘත ආර්ථික ප්‍රතිපත්තියට අනුකූලව ගොවි ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා රාජ්‍ය ආයතන ඉදිරිපත් වීම නතර විය. පොහොර සහනාධාර කපා හැරීම, මහා වාරිමාර්ග සඳහා මෙහෙයවුම් හා නඩත්තු ගාස්තු නියම කිරීම කෘෂි ව්‍යාපෘති සේවා නිලධාරි ක්‍රමය අහෝසි කිරීම වගා නිලධාරී ක්‍රමය වැනි ප්‍රතිපත්තිමය තීරණවලින් යම්කිසි අනිටු බලපෑමක් සිදුවී ඇති බව ග්‍රාමීය ජනතාවගේ හැඟීමයි.** ග්‍රාමීය සමාජයේ දැන උගත් තරුණ පිරිසේ මතය වන්නේ වර්තමාන කෘෂිකර්මය සාපේක්ෂ වශ

අසීරු කරුණක් විය. ඒ නිසා අකමැත්තෙන් හෝ තම ශ්‍රමය අඩු මුදලකට ලබාදීමට ගැමියාට සිදුවිය. එසේ නම්, ග්‍රාමීය මට්ටමේ පවතින විරැකියාව ට හා ඌණ සේවා නියුක්තියට ඇති විකල්ප විසඳුමක් ලෙස ග්‍රාම සංවර්ධන කාර්ය යෙහිදී ''ස්වයං රැකියාව'' යොදගත නොහැකි වේද?

### ග්‍රාමසංවර්ධනය හා ස්වයං රැකියාව

ප්‍රථමයෙන් ග්‍රාම සංවර්ධනය යනු කුමක්දැයි සොයා බලමු. ආචාර්ය රොබට් චේම්බර්ස්ගේ අර්ථ කථනයට අනුව ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වෙන දුප්පත් ජනකොටස් වල හා ඔවුන්ගේ දරුවන්ගේ මූලික අවශ්‍යතා සපුරා ...නීමේ උපක්‍රමයකි ග්‍රාම සංවර්ධනය. ...හිදී ග්‍රාමීය ප්‍රදේශ වල ජීවිකා වෘත්ති යෙහි නියැලෙන දුප්පත්ම ජනකොටස් වලට එම ග්‍රාම සංවර්ධනයේ ප්‍රතිඵල ලබා ගැනීමට හා පාලනය කිරීම සඳහා හවුල් වීමට අත දීමක් අනිවාර්යයෙන්ම සිදුවිය යුතුය. මේ දුප්පත්ම ජන කොටස් සුළු පරිමාණ ගොවීන්, අඳ ගොවීන් හා ඉඩම් නොමැති ගොවීන්ගෙන් සමන්විත වේ. කාතර්සිං නැමැති ඉන්දීය ජාතික සමාජ විද්‍යාඥයාගේ මතය වන්නේ ග්‍රාම සංවර්ධනය පිළිබඳව ජාත්‍යන්තර ලෝකයේ පිළිගත හැකි අර්ථ කථනයක් තවමත් ඉදිරිපත්වී නැති බවයි. ග්‍රාම සංවර්ධනය එක්තරා සංකල්පයක්, සිද්ධි ගණනාවක ප්‍රතිඵලයක් උපාය මාර්ගයක්, විෂය ක්ෂේත්‍රයක් හැටියටද හඳුන්වා දීමට පුළුවන් බව ඔහුගේ පිළිගැනීමයි. ඒ අනුව ග්‍රාමීය අංශයේ කෘෂිකර්මය මූලික කොටගත්, ඒ හා බැඳුණු කටයුතු වල සංවර්ධනයත් ගෘහ කර්මාන්ත හා කලාවන්, සමාජ ආර්ථික යටිතල පහසුකම් මෙන්ම ප්‍රජා සේවාවන් හා පහසුකම් වල දියුණුවක්ද ග්‍රාම සංවර්ධනය තුලින් සිදුවිය යුතුය. ඒ සියල්ලටම වඩා ප්‍රමුඛත්වයක් ලැබිය යුත්තේ ප්‍රදේශයේ මානව හා භෞතික සම්පත්වල වර්ධනයක් ඇති කිරීමටය.

ඉහත සඳහන් කළඅන්දමේ ග්‍රාම සංවර්ධනයක් ස්වයං රැකියා තුලින් සිදු වේදැයි යන්න සලකා බැලිය යුතුය. ස්වයං රැකියාවල මූලික අරමුණ ප්‍රදේශයේ පවත්නා ස්වභාවික සම්පත් හා මානව සම්පත් වලින් හැකි උපරිම ඵල නෙලා ගැනීමයි. මෙරට ග්‍රාමීය ප්‍රදේශවල විරැකියාවෙන් හා ඌණ සේව නියුක්තියෙන් පෙළෙන උගත් තරුණ පරපුරට එළදයි ආර්ථික කටයුත්තක් වශයෙන් තෝරාගත හැකි ස්වයං රැකියා වර්ග මොනවා දැයි පෙන්වා දීම ප්‍රයෝජනවත් විය හැකිය.

### ස්වයං රැකියා වර්ගීකරණය

| කෘෂිකර්මය i | | ශිල්ප (කලාත්මක භාණ්ඩ නිෂ්පාදනය) ii | | | | | නිෂ්පාදනය iii | | සේවාවන් iv | වෙළඳාම v |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| භෝග | පශු සම්පත් | ලෝහ පදනම් කරගත් | ලී පදනම් කරගත් | [illegible] පං බට හා තල් කොල | මැටිභාණ්ඩ | කෙඳි හා සපත්තු | කුඩා අංශය | කුඩා කර්මාන්ත | | |
| ගෙවතු වගාව මල් වගාව සුළු අපනයන බෝග වගාව | කිරි පට්ටි පාලනය කුකුල් පාලනය එළුවන් ඇතිකිරීම ඌරන් ඇතිකිරීම | ස්වර්ණාභරණ රිදී ආභරණ මල් බඳුන් බන්දේසි පිත්තල පහන් ගුරුලේත්තු තඹ වැඩ | ලී කැටයම් වෙස්මුහුණු ගෘහභාණ්ඩ පියසි වැඩ දොර ජනේල කැටයම් කළ සත්තු සහ වෙනත් භාණ්ඩ | මලු, ගෘහභාණ්ඩ අත්බෑග්, ලාම්පු ආවරණ, මේස ඇතිරිලි, පැදුරු පෙට්ටි; හැඹිලි: තොප්පි | කල හට්ටි; වෙනත් මුළුතැන් ගේ උපකරණ; කැටයම් කළ ලාම්පු ලාම්පු ආවරණ පිඟන් මැටියෙන් කළ මල් පෝච්චි බිත්ති සැරසිලි | බුමුතුරුණු පාපිසි පැදුරු හණ පැදුරු ගෘහ භාණ්ඩ බිත්ති සැරසිලි ගෙත්තම් කළ තිර කැස්බෑ ලෙලි අං වලින් කල මල් බඳුන් කුරුල්ලෝ ආදිය | සබන්, හඳුන්කූරු ඉටිපන්දම් | හාල් කෙටීම බතික්, පාවහන් හකුරු මැණික් කැපීම, බේකරි | රෙදි මැසීම කොණ්ඩා කැපීම අලුත් වැඩියා හා නඩත් ා වඩුවැඩ මේසන් වැඩ | සිල්ලර වෙළඳාම තොග වෙළඳාම පදික වෙිදිකා වෙළඳාම රසකැවිලි වෙළඳාම |

ප්‍රධාන කොටස් 05 කට බෙදු වෙන්කළ හැකි මේ ස්වයං රැකියාවලින් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට ඉවහල් වන සාධක කීපයක් පෙන්වා දීම එම රැකියා වල නිරතවීමට බලාපොරොත්තු වන අයට වැදගත් වනු ඇත.

(අ) රැකියාව තම නිවසේම ස්ථානගත කොට පවුලේ ශ්‍රමය/ගමේ ශ්‍රමය උපයෝගී කරගෙන පවත්වා ගෙන යාම

(ආ) ප්‍රාග්ධන සූක්ෂම කර්මාන්තයක් නොවීම

(ඇ) සරල මෙවලම් හා ආම්පන්න යොදු ගැනීම

(ඈ) ගමේ ප්‍රදේශයේ පවතින අමුද්‍රව්‍ය ප්‍රයෝජනයට ගැනීම

(ඉ) ගමේ ප්‍රදේශයේ අලෙවි මධ්‍යස්ථාන මඟින් අලෙවි කළ හැකි දෛනික ජීවිතයේදී අවශ්‍ය වන භාණ්ඩ නිපදවීම

(ඊ) ණය පහසුකම් ලබාගත හැකිවීම

(උ) ව්‍යවසායකත්ව සංවර්ධනයට අවශ්‍ය පුහුණු පහසුකම් ලබාදීමට පිහිටුවාගත් ආයතන තිබීම

(ඌ) ස්වයං රැකියා වල නිරතවී සිටින අයට අවශ්‍ය තොරතුරු හා සේවා ලබා ගැනීමේ පහසුකම් තිබීම

අද රාජ්‍ය අංශය මෙන්ම ස්වේච්ඡා සංවිධාන ද ස්වයං රැකියා වැඩ පිළිවෙලට උනන්දුවක් දක්වමින් ඊට සම්බන්ධවී සිටී. ග්‍රාමීය මට්ටමේදී ස්වයං රැකියා සඳහා අවශ්‍ය පුහුණුව තරුණ පරපුරට ලබාදීමට ස්වේච්ඡා සංවිධාන රාශියක් ඉදිරිපත්ව ඇත. කෙසේ වුවද එක් කරුණක් අවධාරණය කිරීම වැදගත් වේ. එනම් ඒකීත්වයෙන් මිදී දේශීය අවශ්‍යතා හා සම්පත් (අමුද්‍රව්‍ය, මානව) හඳුනා ගෙන ඒවාට ගැලපෙන අන්දමේ ස්වයං

රැකියා ව්‍යාපෘති ආරම්භ කිරීමට අත දෙන්නේ නම්, වැඩිකල් නොගොස් ග්‍රාමීය මට්ටමේ විරැකියාවෙන් පෙළෙන තරුණ පරපුර ඉන් මුදවා ගැනීමට හැකි වෙන බවයි. එසේ නොමැතිව හඳුන්කූරු, පපඩම්, මීකිරි ඉටිපන්දම් වැනි පහසු ස්වයං රැකියා සඳහා පමණක් කාගේත් අවධානය යොමු වුවහොත් ස්වයං රැකියා ව්‍යාපෘතිය තුලින් අරමුණු කෙරෙන අපේක්ෂාවන් ඉටු නොවන අතර, සිදු වන්නේ තවත් ගැටළුවක් නිර්මාණය වීම පමණි.



මැටිවලින් භාණ්ඩ නිෂ්පාදනය කිරීම

ස්වයං රැකියා අඛණ්ඩව පවත්වා ගෙන යෑමටත් ඒ තුලින් විරැකියාවට විසඳුමක් ලබා ගැනීමටත්, ත්‍රිකෝණ විසඳුමක් අවශ්‍ය බැව් පෙනේ. එනම් :—

i. රජය :

සමාජ ආර්ථික යටිතල පහසුකම් දියුණු කිරීම සහ යෝග්‍ය රාජ්‍ය ප්‍රතිපත්ති පිළියෙල කිරීම

ii. ස්වේච්ඡා :

ග්‍රාමීය මට්ටමේ සම්පත් හඳුනාගෙන, සුදුසු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, හා ආයතනයික සංවර්ධන කටයුතු ආරම්භ කිරීම සහ

iii. මූල්‍ය ආයතන :

බැංකු ආධාර ආයතන, අවශ්‍ය ණය පහසුකම් ලබාදීම හා ප්‍රගති සමාලෝචනය සහ ඇගයීම් කිරීම වේ.

**ග්‍රාමීය මට්ටමේදී ස්වයං රැකියා සඳහා අවශ්‍ය පුහුණුව තරුණ පරපුරට ලබාදීමට ස්වේච්ඡා සංවිධාන රාශියක් ඉදිරිපත්ව ඇත, කෙසේ වුවද එක් කරුණක් අවධාරණය කිරීම වැදගත් වේ. එනම් ඒකීත්වයෙන් මිදී දේශීය අවශ්‍යතා හා සම්පත් (අමු ද්‍රව්‍ය, මානව) හඳුනාගෙන ඒවාට ගැලපෙන අන්දමේ ස්වයං රැකියා ව්‍යාපෘති ආරම්භ කිරීමට අත දෙන්නේ නම්, වැඩිකල් නොගොස් ග්‍රාමීය මට්ටමේ විරැකියාවෙන් පෙලෙන තරුණ පරපුර ඉන් මුදවා ගැනීමට හැකිවන බවයි.**

ඉහත පෙන්වා දුන් අන්දමට පෙරමුණු තුනකින් ඒකාබද්ධ වී ඉලක්ක කණ්ඩායම් වල පූර්ණ සහභාගිත්වය තුලින් සැළසුම් සකස් කළහොත් ඒ මගින් ග්‍රාමීය අංශයේ පවත්නා විරැකියාව යම් මට්ටමකට හෝ අඩුකර ගැනීමට හැකිවෙනු ඇත. බොහෝ විට එය සාර්ථක, එමෙන්ම ප්‍රබල එළඹුමක් වීමටද ඉඩ තිබේ. මේ නැඹුරුව සාර්ථක එකක් සේ සිතීමට තුඩු දෙන හේතු කීපයක් දැක්විය හැකිය.

(අ) වියදමට සාපේක්ෂව ( පිරිවැය සඵලදායි) ප්‍රතිඵලදායි ආර්ථික කටයුත්තක් වීම.

(ආ) සුබසාධක වියදම් කපා හැරීමෙන් සිදුවෙන අවාසි මගහරවා අමතර ආදයම් උපදන ක්‍රියාවක් වශයෙන් ප්‍රයෝජනවත් වීම

(ඇ) ස්වේච්ඡා සංවිධාන හා පෞද්ගලික අංශයට රැකියා උත්පාදනය සඳහා අතදීමට අවස්ථාවක් ලබා දීමෙන් රාජ්‍ය අංශයේ බර අඩුකර ගැනීමට හැකිවීම.

(ඈ) ආදයම සාධාරන ලෙස බෙදී යාමේ ඇති ඉඩකඩ වැඩිවීම.

(ඉ) සරල එහෙත් දුප්පත් අයට ප්‍රයෝජනවත් භාණ්ඩ නිපදවීමේ උත්සාහයක් ඇතිවීම.

(ඊ) දේශීය සම්පත් වඩාත් ප්‍රතිඵලදයි ලෙස භාවිතයට ගැනීමට අවස්ථාවක් ලබාගත හැකිවීම.

(උ) ග්‍රාමීය අංශයේ ජනතාව තුල සමාජ ආර්ථික වර්ධනයක් ඇතිකොට ප්‍රබෝධමත් ප්‍රජාවක් ගොඩ නැගීමට හැකිවීම.

ස්වයං රැකියා මඟින් අවසාන වශයෙන් අපේක්ෂා කරනු ලබන්නේ ග්‍රාමීය අංශයේ ජීවත්වෙන දිළිඳු, විරැකියාවෙන් පෙළෙන ජනතාවට සුදුසු ආර්ථික පදනමක් ගොඩනගා ගෙන ස්වාභිමානයෙන් හා ස්වෛරීව ජීවත් වීමට අවශ්‍ය පසුබිමක් ගොඩ නැඟීමයි. මෙම ප්‍රයත්නයේ සාර්ථකත්වය මුළුමණින්ම රඳා පවතින්නේ රජයේ සැළසුම් හා යෝග්‍ය ප්‍රතිපත්ති මත බව ඉඳුරාම පෙනේ. ස්වේච්ඡා සංවිධානවල නායකත්වය හා මූල්‍ය ආයතනවල කැපවීම තීන්දු කරන ප්‍රබල සාධකය වන්නේද රජයේ ප්‍රතිපත්තියම බව නොරහසකි.

ඈත අතීතයේදී, ස්වයං රැකියාව මෙරට යහපත් සාමාජික – ආර්ථික පරිසරයක් ගොඩ නැඟීමට බෙහෙවින් උපකාර වූ බව ඉතිහාසය තුලින් පෙන්වා දෙයි. එසේ නම් බහුතරයක් වෙසෙන ග්‍රාමීය සමාජයේ පවත්නා දිළිඳුකම, ආදයම්, විෂමතාවය, දුර්වල පෝෂණ මට්ටම යන නොයෙකුත් ප්‍රශ්ණ වලට පිළිතුරක් ලබා ගැනීමට ස්වයං රැකියාව එක් සාර්ථක එළඹුමක් විය හැකි බව පැහැදිලි සත්‍යයකි. ප්‍රදේශයේ පවත්නා භෞතික හා මානව සම්පත් වලින් නිසි ප්‍රයෝජන ගැනීමට අවස්ථාවක් ග්‍රාමීය ජනතාවට සළසා දෙන්නේ නම්, එය එම ප්‍රදේශයේ සමාජ ආර්ථික ප්‍රගතියට අතදීමක් වන්නේය. සුළු පරිමාණයේ ගොවියාගේ, අඳ ගොවියාගේ, ඉඩම් නොමැති ගොවියාගේ ජීවන මට්ටම උසස් වීම සමාජ ආර්ථික ප්‍රගතිය සමඟ එකට බැඳී පවතී. එහෙයින් ප්‍රදේශයේ පවත්නා සම්පත් හා මානව කුශලතා පදනම් කරගෙන අරඹනු ලබන ස්වයං රැකියා තුලින් සංවර්ධන වේදින් බලාපොරොත්තු වන අන්දමේ ග්‍රාම සංවර්ධනයක් ඇති කරලීමට සුදුසු සාධක හා පරිසරයක් ගොඩනඟා ගතහැකි බව පැහැදිලි වෙයි.


## ගොවි ජනතාව පෙරමුණේ
## ගොවි ජනතාවට පිදුන උපහාරය
## ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය
## තෙවසරක් සපුරයි !

ගොවි ජනතාවට,

**අවුරුදු 60 සිට ජීවිතාන්තය දක්වා විශ්‍රාම වැටුප්**
**හදිසි ආපදාවකදී, අකල් මරණයකදී රු. 50,000/- දක්වා**
**එකවර ගෙවන වන්දි මුදල්**

**1987 ආරම්භ වූ මෙම යෝජනා ක්‍රමය තුලින් 1990. 12. 31 වෙනි දිනට ගොවීන් 205 දෙනෙකු වෙනුවෙන් බෙලහීනතා ප්‍රතිලාභ හා මරණ පාරිතෝෂික වශයෙන්**

**රුපියල් විසිඅට ලක්ෂ දහහත් දහසක් දනටමත් ගෙවා ඇත.**

**මේ ප්‍රතිලාභ ලැබීමට ඔබටත් අවස්ථාවක්! ඔබත් අදම ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයට ඇතුලත් වන්න**
**වියපත් දිවියට සැනසුම ගෙන එන**

## ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය
**ගොවි ජනතාවගේ අනාගතය සුරක්ෂිත කෙරෙයි.**

**විමසන්න:—**

# කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය

**267, යූනියන් පෙදෙස,**
**කොළඹ 2.**
**හෝ සෑම දිස්ත්‍රික්කයකම පිහිටි**
**දිස්ත්‍රික් කෘෂිකර්ම රක්ෂණ මණ්ඩල කාර්යාල.**